# ලෝකාලෝකය

2020 ජූලි - සැප්තැම්බර් කලාපය

ස්වාමීන්වහන්සේ ගැන බලා සිටින්නෝ තමුන්ගේ සවිය
අලුත්කරගන්නෝය; ඔව්හු රාජාලීන් මෙන් පියඹා නගින්නෝය;
ඔවුහූ දුවන්නෝය, එහෙත් වෙහෙස නොවෙති.
ඔවුහු ඇවිදින්නෝය, එහෙත් ක්ලාන්ත නොවෙති
(යෙසායා 40 : 31).

ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය
අංක - 07, විවේකානන්ද පාර, වැල්ලවත්ත, කොළඹ 06.
දුරකථන අංක : 011 2581901

ළමා පිටුව

# සුවය



ආදර දුවේ පුතේ, කොහොමද ඉතින් ඔයාලට? පසු ගිය මාස කිහිපය පුංචි ඔබට වගේම වැඩිහිටි අපටත් වෙනස් ආකාරයක අත්දැකීමකට මුහුණ දෙන්නට සිදුවුණා. ගෝලීය වශයෙන් සීඝ්‍රයෙන් ව්‍යාප්ත වුන **"කොරෝනා"** වසංගතය නිසා අපි හැමෝටම පසුගිය කාලය නිවසටම වෙලා ගත කරන්නට අපට සිදුවුණා. ඒක ටිකක් අමාරු දෙයක් වුනාට, පවුලේ හැමෝමත් එක්ක එකට කාලය ගත කරන්න ලැබීම නම් හොඳ දෙයක්. ඒ වගේම ඔයයි, ඔයාගේ පවුලේ හැමදෙනාමයි මේ වසංගතයෙන් ආරක්ෂා කළ ආදර දෙවියන්වහන්සේට ස්තූති ප්‍රශංසා කරන්න අමතක කරන්න එපා.

පසුගිය කාලය පුරාම ලෙඩ රෝග සහ ඒවායින් පීඩාවට පත්වුන අය ගැන පුංචි ඔබට නිතර අසන්නට සහ දකින්නට ලැබුන නිසා, යේසුස්වහන්සේ මේ පොළොවෙහි සිටි කාලයේ රෝග වලින් පීඩි විඳි ජනතාවට මහත් සේ අනුකම්පා කර ඔවුන් සුවපත් කළ ආකාරය ගැන ශුද්ධ බයිබලයෙන් කතා 2ක් පුංචි ඔයාලට කියලා දෙන්නම්. ඔයා ඒවා හොඳින් මතකයේ තබාගන්න.

**මාර්ක් ශුභාරංචි පොතේ 1:40-41** පදවල මෙලෙස සඳහන් වෙනවා. **"කුෂ්ඨ රෝගියෙක් උන්වහන්සේ ළඟට ඇවිත් දණින් හිඳ, ඔබවහන්සේ කැමති සේක් නම් මා පවිත්‍ර කරන්ට ඔබට පුළුවනැයි කියා අයැද සිටියේය. උන්වහන්සේ අනුකම්පාවෙන් යුක්තව අත දිගු කොට ඔහු පිට තබා, කැමැත්තෙමි, පවිත්‍රවෙයන්නැයි ඔහුට කීසේක. එකෙණෙහිම කුෂ්ඨය ඔහුගෙන් පහවී, ඔහු පවිත්‍ර කරනු ලැබීය".** බලන්න දුවේ පුතේ කුෂ්ඨ රෝගියෙක් කියන්නේ ඇඟ පුරාම සැරව ගලන තුවාල පිරිලා ඉන්න කෙනෙක්ට. තුවාල වේදනාවෙන් ඔහු බොහෝ

ඉතිරි කොටස සඳහා 08 පිටුව බලන්න

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අනේකාලංකාරය

**ගීතාවලිය 27:4** දාවිත් රජතුමාගේ හදවතේ ආසාව සඳහන්ව ඇත. **"ස්වාමින්වහන්සේගෙන් එක දෙයක් ඉල්ලමි, ඒක සොයන්නෙමි, එනම් ස්වාමීන්ගේ අලංකාරය දකින පිණිසත්......"** වර්තමානයේ කිතුණුවන් වන අපත් ස්වාමීන්වහන්සේ වන යේසුස්වහන්සේගේ අලංකාරය දැක ගැනීමට ආසා කළ යුතු යැයි සිතමි. උන්වහන්සේගේ බාහිර රූපයේ අලංකාරය නොව, උන්වහන්සේගේ චරිතයේ අනේකාලංකාරය දේව වචනය තුලින් අපට දැක ගත හැක.

**"මෙන්න මනුශ්‍යයා" - (යොහාන් 19:5).**

**"අන්න, ලෝකයේ පාපය දුරු කරන දෙවියන්වහන්සේගේ බැටළු පැටවාණෝ" - (යොහාන් 1:29).**

අප යේසුස්වහන්සේගේ අනේකාලංකාරය දෙස බලන කල එය දෙයාකාරව දැකිය හැකිය. එනම් සියයට සියයක්ම දෙවියන්වහන්සේගේ පුත්‍රයා ලෙසත් සියයට සියයක්ම මනුෂ්‍යයා ලෙසත්ය. අද මා උත්සාහ කරන්නේ යේසුස්වහන්සේ තුල තිබෙන්නාවූ මනුෂ්‍යත්වයේ එක ගුණාංගයක් දෙස බලා එය අපගේ දිනපතා ජීවිතයට අදාල කරගන්නේ කෙසේද? යන්න බැලීමටයි.

## යේසුස්වහන්සේගේ මෘදුකම

**"මම සිතින් මෘදුව යටහත්ව සිටින බැවින්....." (මතෙව් 11:29).** යේසුස්වහන්සේ මිහිමත ජීවත් වූ කාලය තුලදී උන්වහන්සේගේ කැපී පෙනෙන චරිත ලක්ෂණයක් වූයේ මෘදුකමයි. මෘදු ලෙස මිනිසුන් සමඟ ආශ්‍රය කිරීම තුලින් බොහෝ පව්කාර මනුෂ්‍යයන්ගේ ජීවිත වෙනස් විය. උන්වහන්සේගේ වචන මෘදු විය, ඊට හේතුව වූයේ උන්වහන්සේගේ හදවතේ මෘදු භාවයයි. ආදරවන්තභාවය, ආචාරශීලීභාවය, නම්‍යශීලීභාවය, අව්‍යාජභාවය, කාරුණිකභාවය, ප්‍රියමනාපභාවය, ඍජුභාවය වැනි ගති ලක්ෂණයන් මටත්, ඔබටත් නැති බව හොඳින් සිතා බැලුවොත් අපට පෙනේ. යේසුස්වහන්සේ වෙතට පැමිණි අයගේ ජීවිත වෙනස් වීමට ප්‍රධාන වශයෙන් බලපෑ ගුණාංගය වූයේ උන්වහන්සේගේ මෘදු චරිත ගුණාංගයයි. එවැනි පුද්ගලයන් කිහිප දෙනෙකු දෙස අප බලමු.

## සමාරිය ස්ත්‍රියගේ කතාව යොහාන් 4 : 1 -42

සමාරිය ස්ත්‍රිය යේසුස්වහන්සේට මුණ ගැසෙන්නේ දවල් 12.00ට පමණ යාකොබ් ගේ ලිඳ ළඟදීය. සාමාන්‍යයෙන් දවල් දොළහට වතුර රැගෙන යාමට ස්ත්‍රීන් නොපැමිණේ. අද ද අප රටේ ද මෙය සිදු වේ. අන් ස්ත්‍රීන්ට මුහුණ දීමට හැකියාවක් නොමැති නිසාත්, ලැජ්ජාව නිසාත් අන් අය ළිඳ ළගට නොපැමිණෙන වේලාවේදී ඇය පැමිණියාය. ඒ ඇයගේ ජිවිතේ තිබුණ පාපකාරී ස්වභාවය අන් අය දන්නා බැවිනි. ඔබත් ඇයගේ කථාව බයිබලයෙන් කියවා බලන්න. ළිඳ ළග සිටි යේසුස්වහන්සේ සමඟ ඇය කල කතා බහෙන් පසු ඇගේ ජීවිතය සම්පූර්ණයෙන්ම වෙනස් විය. එපමණක් නොව බොහෝ ආත්මික කාරණා යේසුස්වහන්සේ ඇයට ඉගැන්වූ සේක. නමස්කාරය පිළිබඳ ඇයට කියා දුන් සේක. ඇයගේ ජීවිතය වෙනස් වූයේ උන්වහන්සේ තුල තිබුණ ඒ

අප්‍රමාණ මෘදුභාවය නිසාය. උන්වහන්සේ ඇය වරදට පත් නොකලසේක.

## සාකෙවුස්ගේ කතාව - ලූක් 19:1-10

සාකෙවුස් යනු වංචාකාර, ලෝබ, නපුරු බදු අය කරන රාජ්‍ය නිලධාරියෙකි. මහජනතාවට එපාකල පුද්ගලයෙකි. නිතරම ජනතාවගේ අප්‍රසාදයට ලක් වූ පුද්ගලයෙකි. එහෙත් දිනක් කිසිම පුද්ගලයෙකු යාමට කැමති නැති නිවසක් වූ සාකෙවුස්ගේ නිවසට යේසුස්වහන්සේ ගියසේක. එදා ඔහුගේ ජිවිතය වෙනස් විය. වෙනදා දුප්පතුන්ගෙන් පැහැර ගත් සාකෙවුස් එදා දුප්පතුන්ට බෙදා දුන්නේය. සියයට සියයක්ම ඔහු වෙනස් පුද්ගලයෙකු බවට පත් විය. එය එසේ වූයේ උන්වහන්සේගේ මෘදු ආදරවන්තභාවය නිසාය. උන්වහන්සේ සාකෙවුස්ව හෙළා දැක්කේ නැත.

## පේත්‍රුස්ගේ කතාව - ලූක් 22:31-65

පේත්‍රුස් යේසුස්වහන්සේගේ ගෝලයෙකි. බොහෝ කාලයක් උන්වහන්සේ සමඟ එකට සේවය කලේය. නමුත් අවසාන මොහොතේ එනම් යේසුස්වහන්සේ අත් අඩංගුවට පත් වූ වේලාවේදී උන්වහන්සේ පාවාදුන් සේක. යේසුස්වහන්සේ හඳුනන්නේ නෑ කියා තුන්වතාවක්ම පැවසූහ. එහෙත් උන්වහන්සේ පේත්‍රුස් සමඟ අමනාප වූයේ නැත, අත්හැරියේ නැත, පළිගත්තේ නැත. පසුව උන්වහන්සේ සොයාගෙන පැමිණ පේත්‍රුස් ස්ථාපිත කර නැවත සේවයේ යොදවා ගත්සේක. පසුකාලීනව පේත්‍රුස් සභාවටත්, යේසුස්වහන්ස්ටත් ප්‍රයෝජනවත් විය. එසේ වූයේ යේසුස්වහන්සේ ඉතා නම්‍යශීලිව හා මෘදු ලෙස ක්‍රියා කිරීම නිසාය.

මෙවැනි චරිත බොහෝමයක් බයිබලයේ අලුත් ගිවිසුම බැලූ විට අපට පෙනේ කාමමිත්‍යාචාරික ස්ත්‍රිය **(යොහාන් 8:1-11)**, තෝමස් **(යොහාන් 20:20-27),** පාවුල්තුමා **(ක්‍රියා 9:16),** තවත් බොහෝ දෙනාගේ ජිවිත වෙනස් වීමටත්, ඔවුන් දෙවියන්වහන්සේගේ සේවකයන් බවට පත් වීමටත් බලපෑවේ යේසුස්වහන්සේ තුල තිබුණාවූ මේ මෘදු ගුණාන්විතභාවයයි.

වර්තමානයේ කිතුණුවන් වන අප මෘදුකම කෙසේ අපගේ දිනපතා ජිවිතයට අදාල කර ගනිමුද?

## ⋆ දරුවනි - එපීස 6:1-2 / හිතෝපදේශ 4:2

මෙහිදී දරුවන්ගේ වගකීම වන්නේ දෙමවුපියන්ට හා වැඩිහිටියන්ට ඉතා මෘදු ගුණාත්මකභාවයකින් යුතුව කටයුතු කිරීම. මවට, පියාට ගෞරවය දීම හා යටහත්භාවයෙන් හැසිරීම මගින් තම මව හා පියා සතුටු කිරීම මෙන් ඒ මගින් අවසානයේ දෙවියන්වහන්සේට ගෞරවය ගෙන දීමය.

## ⋆ පියවරුනී / මව්වරුනී එපීස 6:4 / කොලොස්සි 3:21

දෙමාපියන් වන සියල්ලන්ගෙන්ම දෙවියන්වහන්සේ බලාපොරොත්තු වන්නේ දරුවන් කෝප නොකර, ආදරවන්තභාවයකින් හා මෘදුභාවයකින් ඇති දැඩි කරන ලෙසය. තම කෝපය පිට කිරීම උදෙසා දරුවන්ට බැන වැදීම හා පහර දීම නොකල යුතු අතර දරුවන් හා දෙමාපියන් අතර හොඳ සම්බන්ධතාවයකින්, ප්‍රියමනාප භාවයකින් යුතුව කටයුතු කළ යුතුය. එමගින් දරුවන්ගේ යහපත මෙන්ම හොඳ කිතුණු පවුලක සාක්ෂිය ගොඩ නගා ගත හැක. අවසානයේදී දෙවියන්වහන්සේට මහිමය හිමි වේ.

## ★ භාර්යාවනී
## 1 පේත්‍රුස් 3:1-4 / එපීස 5:22

භාර්යාවන් සඳහා දේව වචනයේ යටහත් භාවයකින් යුතුව හැසිරීමට පොළඹවයි. බාහිර අලංකාරයට වඩා හදවතේ මෘදුභාවය හා කරුණාවන්තභාවය තියුණු කර ගන්නා ලෙස දේව වචනය දිරිගන්වයි. තම ස්වාමි පුරුෂයා හා දරුවන් රැකබලා ගැනීම හා පෝෂණය කිරීම කරන අතර ක්‍රිස්තුස්වහන්සේ තුල තිබුණු මෘදුකම හා යටහත්භාවය යුතුව එසේ කරන ලෙස බයිබලය සියලු භාර්යාවන්ගෙන් ඉල්ලා සිටියි. එමගින් පවුලේ සමගිය හා ආරක්ෂාව හා වර්ධනය ඇති වන අතර කිතුණු පවුලක සාක්ෂිය තුලින් දෙවියන්වහන්සේට ගෞරවය අත් වේ.

## ★ ස්වාමි පුරුෂයිනි
## කොලොස්සි 3:19 / 1 පේත්‍රුස් 3:7

දේව වචනය ස්වාමිපුරුෂයන්ට අවවාද කරන්නේ තම භාර්යාවන් කෙරෙහි කර්කෂ නොවී භාර්යාවන්ගේ දුර්වලතාවයන් ඉවසා ගෞරවයෙන් යුතුව ක්‍රියා කරන ලෙසය. තම භාර්යාවට කොන්දේසි විරහිතව ප්‍රේම කරන මෙන්ද, තම ශරීරයට ප්‍රේම කරන ලෙස තම භාර්යාවට ප්‍රේම කල යුතු බව දේව වචනයේ සඳහන් වේ. ආදරවන්තභාවය, නම්‍යශීලිභාවය, ගෞරවාන්විතභාවය, ආචාරශීලිභාවය වැනි යේසුස්වහන්සේ තුල තිබුණු ගුණාංග පුරුෂයන් තුලද තිබේවා. ඒ තුලින් ස්වාමී වු යේසුස්වහන්සේගේ නාමය ගෞරවයට පත් වෙනවා ඇත.

## ★ දාසයනි - එපීස 6:5
## 1 ප්‍රේතැස් 2:18 / තීතස් 29

තමා රැකියාව කරන ස්ථානයේ තම ස්වාමිවරුන්ට (Boss) ගෞරවයෙන් යුතුව කීකරුව ක්‍රියා කල යුතු බව කිතුණු රැකියා කරන සියලු දෙනාගේම වගකීමකි. ස්වාමියා කොයි ආකාරයේ හැසිරුණත්, කිතුණුවන්ගේ වගකීම වන්නේ වර්ජන, උද්ඝෝෂන, වෘත්තීය සමිති ක්‍රියාමාර්ග වලට නොගොස් සමාදානයේ ක්‍රියා මාර්ග තෝරා ගත යුතු බවයි. එමගින් දෙවියන්වහන්සේගේ නාමය ගෞරවයට පත් වන අතර තම ආශිර්වාදය උන්වහන්සේ වෙතින් පැමිණෙනවා ඇත..

## ★ ස්වාමිවරුණි
## කොලොස්සි 4:1 / එපීස 6:9

රැකියා ආයතනවල ප්‍රධානීන් ලෙස කිතුණුවන් පත් වී සිටින විට ඔවුන් යටතේ වැඩ කරන අය සම්බන්ධයෙන් ක්‍රිස්තු චරිතයේ ගුණාංග පෙන්නුම් කල යුතු බව දේව වචනය පෙන්වා දෙයි. මෘදු ලෙසත්, ආචාරශීලි ලෙස මෙන් සාධාරණ ලෙසත් ක්‍රියා කළ යුතුව ඇත. ස්වාමීවූ යේසුස්වහන්සේ මේ පිළිබඳ ගණන් ගන්නා බවයි බයිබලය හඟවා දෙන්නේ. ප්‍රධානියා, අයිතිකරු ඔබ නම් රැකියා ආයතනයේදී ඔබගේ සේවකයන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේදී යේසුස්වහන්සේ මෙන් ක්‍රියා කිරීම තුලින් උන්වහන්සේට ඔබගේ ආයතනයේ කරණ කොට ගෙන ගෞරවය ගෙන දිය හැක.

**"මම සිතින් යටත්ව මෘදුව සිටිමි. එබැවින් මාගෙන් ඉගෙන ගනිල්ලා" - (මතෙව් 11:29).** යේසුස්වහන්සේ අපි සියලුදෙනාටම ආරාධනා කරයි. මනුෂ්‍යයෙකු ලෙස උන්වහන්සේ ජීවත් වූ කාලයේ මෘදු ගුණාන්විතව ක්‍රියා කල සේක. අපිත් උන්වහන්සේට ගෞරවය ගෙන දෙන අතර ස්වර්ග රාජ්‍ය උදෙසා වැඩ කරමු. දෙවියන්වහන්සේ ඔබ සැමට ආශිර්වාද කරන සේක්වා.

**සංස්කාරක**
**- එස්. මෙත්තානන්ද -**
**077 8813197**

# බාධක මැද ජීවිතයේ අල්ලා ගත යුතුම දේ.

අප ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මෙලොව ජීවත් වූ වසර තිස් තුනහමාරක කාලය තුල සිදු කල මළවුන් නැගිටෙව්වාවූ රෝගීන් සුව කලා වූ වැනි නොයෙකුත් බලවත් ක්‍රියාවන් කිසිවෙකු විසින් අන් කවර යුගයකවත් සිදු නොවූහ. දේව වචනයේ සුභාරංචි පොත් සතර තුල උන්වහන්සේ සිදු කල ඒ බලවත් ක්‍රියාවන් පිළිබඳ කතා කරයි. මා ඔබ සමඟ කතා කරන්නට යන්නේ ඒ සුව කලාවූ රෝගීන් අතර සුවය ලැබුවාවූ තවත් එක්තරා රෝගියෙකු පිළිබඳවයි. ඒ ස්ත්‍රියකි. ඈ පිළිබඳ **ශුද්ධවූ මාර්ක් පොතේ 5:25 ද මතෙව් 9:18, ලූක් 8:40** හිද දැකිය හැකිය. මෙහි ඇයගේ නමක් සඳහන්ව නොතිබුනත් ඈ කල ක්‍රියාව අති විශිෂ්ඨය. තවද මෙම පරිච්ඡේදයන් තුලින් අපට දක්නට සුවිශේෂී දෙයක් ඇත. මිනිසාගේ සිය ජීවිත කාලය තුලදී ලබාගත යුතුම දෙයක් පිළිබඳව ඈ තුලින් අප උගනිමු. මිනිසා තම ජීවිත කාලය තුලදී ඔහු බොහෝ අපේක්ෂා කරා ඇදී යයි.

රැකියා ස්ථානයන් හෝ වෙනත් ස්ථානයන් තුල තමාට ලබාගන්න ඕනෑ කරන්නාවූ කිසියම් දෙයක් සඳහා උදාහරණයකට :- රැකියා ස්ථානයේ කිසියම් උසස්වීමක් ලබන්නට බොහෝ බාධා බොහෝ අභියෝගයන් වලට මුහුණපාමින් සියලු සිත් වේදනාවන් උසුලමින් ගමන් කොට තමාගේ අරමුණ කරා කෙසේ හෝ ලඟාවීමට සිතති. ඒ සියලු අභියෝගයන් මැද ඔවුහූ තමාට ඕනෑකෙරු දේ යම් දිනක ලබා ගනියි. නමුත් මිතුර මිතුරිය අස්ථිර ලොවක් තුල මිනිසා වෙහෙස දරා ලබාගන්නා මෙම අස්ථිර දේවල් මධ්‍යයේ මිනිසාගේ ජීවිතයට අත්‍යවශ්‍යම ඉතා වටිනාම දෙය මිනිසාට මගහැරී අතහැරී යන බව ඔබ දන්නවාද? ඒ කුමක්ද කියා මෙම ස්ත්‍රිය ඔබට මට දේව වචනය තුලින් පෙන්වා දෙයි.




12 වසරක් මුළුල්ලේම තම ශාරීරික රෝගයක් හේතුවෙන් බොහෝ පීඩා විඳ නොයෙකුත් වෙදුන් හට තම ධනය වැය කොට කිසිදු සුවයක් නොලැබුනු ඈ ජීවනදායක ස්වාමින්වහන්සේව ඇල්ලූ සැනින් ඈ එතෙක් කලක් පීඩා වින්දාවූ රෝගය පහව ගොස් පූර්ණ සුවය අත් කර ගත්තාය. දේව වචනයෙහි ඇගේ නමක් ජාතියක් සඳහන් නොවුනද එම කාන්තාව අපූරු පණිවිඩයක් සමස්ථ මිනිස් ප්‍රජාවටම කියා පායි. ඇගේ ජීවිතයේ සුවය උදෙසා ඈ බොහෝ මිල මුදල් වැය කල නමුත්, ඈ නියම සුවය ලැබුවේ තම පව්බර දිවියට ස්වාමීවූ යේසුස්වහන්සේව හමුවීමෙන් අනතුරුවය. වර්තමානයේ බොහෝ මිනිසුන් තම ධනය වැය කොට නොයෙකුත් ධර්ම චාරිත්‍ර සිදු කරමින් සැනසෙන්නේ ඉන් තමාට විමුක්තිය

සලසා ගැනීමට හැකිවේයැයි සිතමිනි. මින් අපට පෙන්වන්නේ මෙම ස්ත්‍රිය සිය ධනය වැය කොට තම රෝගය සුවකර ගැනීමට නොයෙකුත් වෙදුන් පසුපස ගිය ගමනය. ඇතැම් විට ඈ ජීවිතයේ වෙහෙසට පත්ව ස්වාමීන්වහන්සේ වෙතට ආ ගමන තමා විසින් ගත් අවසාන තීරණය වන්නට පුළුවන. කෙසේ හෝ අද ප්‍රමාද වී හෝ නිවැරදි තැනට ඒම අපටද මහඟු ආදර්ශයකි. මනුෂයෙකු සිය ධන බලයෙන් කිසිදු විටක තම ජීවිතය සදාකාල විනාශයෙන් ගලවා නොගනියි. අනිත් කරුන නම් මෙම ස්ත්‍රියට යේසුස්වහන්සේ වෙතට ඒමට තිබූ ගමන ඉතා පහසු නොවූ බව මෙය කියවන අපට පැහැදිලි වේ. ඒ මන්ද සෙනඟ බොහෝ වැඩි බැවින් තෙරපීම නිසාම ඒ ගමන ඈට ඉතා අපහසු කාර්යයක් විය. එය කොතෙක් අපහසු වුවද ඈ සෙනඟ දැක පසුබට නොවූහ. කෙසේ හෝ තම අරමුණ වෙතට ලඟාවීම ඇගේ එකම උත්සාහය සහ අධිෂ්ඨානය විය. එදා මෙන්ම අදද ජීවන දායක යේසුස්හන්සේ වෙතට එක එල්ලේ ගමන් කිරීම කිසිවෙකුට පහසු කාර්යයක් නොවීය. උන්වහන්සේ අනුව ගමන් කරන විට බොහෝ බාධක වලට මුහුණදීමට සිදුවෙති. ඇතැම්විට නිවැසියන් පවා ඊට බාධාවන් ගෙන ආ අවස්ථාවන් බහුලව ඇත. එහෙත් මෙම ස්ත්‍රියගේ පණිවිඩයේ අන්තර්ගතය වන්නේ බාධා මැද නොසෙල්වී එක එල්ලේ ස්වාමින්වහන්සේව අල්ලා ගැනීම පිළිබඳවය. වර්තමානයේ මෙම ස්ත්‍රියගේ එම ක්‍රියාව ප්‍රායෝගිකව ක්‍රියාවට නංවන්නේ ඉතාමත් ස්වල්ප දෙනෙකි. බහුතරයක් දෙනෙකු සිදු කරනු ලබන්නේ සෙනඟ නැමති බාධා ඉදිරියේ තම ගමන නවතා තම පරණ පුරුදු අපිරිසිදු ජීවිතයට හැරී යාමයි.

**"ලෝකයෙහි නුඹලාට බොහෝ පීඩා ඇත්තේය. ධෛර්යමත් වෙයන්න. මම ලෝකයෙන් ජය ගතිමි" යොහාන් (16:33), (ක්‍රියා 7:58), (ගීතාවලිය 34:19)** මෙම ස්ත්‍රිය විශාල සෙනගක් මැද තෙරපෙමින් ගොස් උන්වහන්සේගේ සළුවේ දාවල්ලට අත ගැසුවේ අපටද මෙය සිහි කැඳවමින් මදක් සිතන්න. ඈ සෙනග දැක යලි ආ පිටට හැරුනේනම් කිසිදු සුවයක් ඈට නොලැබෙනු ඇත. අද නොයෙකුත් බාධා මැද උන්වහන්සේව අතහැර යන්නන්ට කිසිදු දිනක ඒ ආත්මික සුවය අත්විදින්ට නොහැකි වනු ඇත. වරක් ගෙත්සෙමන උයනේදී උන්වහන්සේව තනිකර සියල්ලෝම පලා ගිය බව **ශු. මාර්ක් 14:50** කියවන විටදී අපට පෙනීයයි. මෙම පීඩා හමුවෙහි උන්වහන්සේව අතහැර දිව්වාවූ කණ්ඩායම අතර ඔබ සිටිනවාද යන්න සිතා බලන්න. අප කිසිදු විටක එබදු පරාජිත තත්වයක සිටින්නේ නොවෙමු. සැබැවින්ම උන්වහන්සේව අතහැර පලායන්නන්ට දිය හැකි එකම පිළිතුර වන්නේ **ලූක් 9:62** වැනි පදයයි. (ඔබේම බයිබලය පෙරළා බලන්න) **(මාර්ක් 5:32) ඒ දේ කල ස්ත්‍රිය දකින පිණිස උන්වහන්සේ අවට බැලූ සේක.** (බලන්න) **2 ලේකම් 16:9**, සොයුර සොයුරිය, මෙම ස්ත්‍රිය සැබවින්ම ලොවට හඬ නගා කියන්නේද බාධා ඉදිරියේ මිනිසාගේ ජීවිතයට ඕනෑ කරන ඉතා උතුම්ම දේ වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේව අල්ලා ගන්නේ නැතිව කුමන දෙයක් අල්ලා ගත්තත් ඉන් ඵලක් නැති බවයි. අප ලබාගන්න අන් සියලුම ලෞකික දේ දිනක ක්ෂය වී යති. එසේනම් කිසි දිනක පහ නොවන සදාකාල ජීවනය අල්ලා ගැනීම ඔබව සදාකාල මරණයෙන් නිදහස් කරනු ඇත.

**- මැතිව් ප්‍රියංකර ෆොන්සේකා -**

පීඩා වින්ඳා. ඔබට ඒ වේදනාව ගැන සිතාගන්නවත් බැහැ. නමුත් ඔහු යේසුස්වහන්සේ ළඟට ඇවිත් **"මා සුවකරන්න ස්වාමීනී"** කී සැණින් ඔහුව සුවපත් කරන්නට තරම් මේ රෝගියාට යේසුස්වහන්සේ ප්‍රේම කළා.



එසේම, **මාර්ක් 9:14-28** පදවල මීමැස්මොර රෝගයෙන් බොහෝ පීඩා විදි ළමයෙක් යේසුස්වහන්සේ වෙතට ගෙනා පසු උන්වහන්සේ ඔහුව සුව කළ ආකාරයයි. මෙම කතාව කෙටියෙන් ඔබට කියන්නම්. **"එක් පියෙක් ගොළු ආත්මයක් ආවේශ වූ ඔහුගේ පුතා යේසුස්වහන්සේ ළඟට ගෙනවිත් 'ස්වාමීනි, මගේ පුතාට ගොළු ආත්මයක් ආවේශව තිබේ. එම ආත්මය ආවේශ වන හැම මොහොතම ඔහු බිම වැටී පෙණ දමා, දත්මිටි කා දුර්වල වෙනවා. ඔබට යමක් කරන්නට පුළුවන් නම් අනුකම්පා කර පිහිටවුව මැනවයි'යි පියා යේසුස්වහන්සේට කී විට උන්වහන්සේ ඒ ළමයාට අනුකම්පා කර ඔහුව සුවකර පියාට ළමයා භාරදුන් සේක".** හිතන්න දුවේ පුතේ, ඒ ළමයාගේ පියාට මොනතරම් සතුටක් දැනෙන්න ඇති නේද?

මේ විදිහට බොහෝ දෙනෙක් සුවකරන්න, මරණින් නැගිටුවන්නට, යේසුස්වහන්සේ ක්‍රියා කළා. උන්වහන්සේගෙන් සුවය බලාපොරොත්තු වුන හැම දෙනාම සුව කළා. උන්වහන්සේ මේ හැමෝටම ගොඩාක් ආදරය කළා. දුවේ පුතේ සුවය අවශ්‍යය වෙන හැම වෙලාවකම අපේ දෙවිපියාණන්වහන්සේට යාච්ඥා කර සුවය ඉල්ලන්න. උන්වහන්සේ ඔයාත්, ඔයාගෙ පවුලේ සියළු දෙනාමත් සුව කරන සේක.


ඉතින් දුවේ පුතේ මේ දවස්වල ඔයාලා අමතක නොකර කරන හොඳ සෞඛ්‍යය පුරුදු අනුගමනය කරන්න. නිතරම සබන් දා අත් සේදීම, අනවශ්‍ය ලෙස මුව, නැසය සහ ඇස් නොඇල්ලීම, සෙනග එක් රැස් වන ස්ථානවල නොගැවසීම හා මුව ආවරණයක් පැළදීම. මේ හොඳ පුරුදු සෞඛ්‍ය සම්පන්න ජීවිතයකට ඔබට උදව් වේවි. ඒවගේම අතපසු නොකර අධ්‍යාපන වැඩකටයුතු හොඳින් කරන්න. ඔබට යේසු පිහිටයි.

මීට,
ආදර,
**- ශෂිලා නැන්දා -**



# කටු.

කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල ජීවත්වන අය පමණක් නොව පිටපලාත්වලින් පැමිණෙන බොහෝ අය නරඹන්නට අමතක නොකල තැනක් තිබේ. ඒ තමයි කොළඹ කෞතුකාගාරය. කෙටියෙන් **"කටුගෙය"** යැයි භාවිතාවේ. පෙර රජ දවස තිබූ සිංහාසන ඔටුනු පමණක් නොව මහනුවර රජමැදුරේ පාවිච්චි කරන ලද වැසිකිලිවල ශේෂවී ගිය කොටස් පවා මෙම කටුගේ තුල දැකිය හැකිය. සමස්තයක් වශයෙන් කටුගේ අපට කියාපාන පණිවිඩය පැහැදිලිය. සියල්ල අවසනට පැමිණිය යුතුය. සියල්ලම ක්ෂයවී නටඹුන් බවට පත්වේ. සදාකාලික, අමරණීයවූ කිසිවක් නැත. ලස්සන සැමදේ, සියලු බලවත් දේ යම් දිනකදී විරාමයක් දකිනු ඇත. **"අහසත්, පොලොවත් පහව යන්නේය. එහෙත් මාගේ වචනය පහව නොයන්නේය"** දෙවියන්වහන්සේ කියන සේක. පදාර්ථය මැවීමට හෝ නැසීමට හෝ නොහැකි බව ඊනියා ස්වභාවය ධර්මයේ නීතිය වුවත් ස්වභාව ධර්මයේද ස්වාමියා වන දෙවියන්වහන්සේ කිසිම විද්‍යාත්මක හෝ අවිද්‍යාත්මක නීතියක් යටත් නැත. කිසිවක් ඉතිරි නොවන ලෙස සියල්ල විනාශ කිරීමට දෙවියන්වහන්සේට පුලුවන. එනම් ඊයෙත්, අදත් පවතින සෑම බලවත් දෙයක්ම හෙට දිනෙක **"කටු"** බවට අවශේෂ වනු ඇත.



අති ප්‍රබල න්‍යෂ්ඨික බෝම්බ ගැන උදන් අනමින් උන්මාදයෙන් ක්‍රියා කරන බලවත් රටවල් පොළොවේ මිනිසාගේ ශ්‍රේෂ්ඨත්වය හා ප්‍රෞඩත්වය ගැන වහසි බස් දොඩයි. තාක්ෂණික, ඉලෙක්ට්‍රොනික, පරිගණක, ජීව රසායන, යනාදී නොයෙකුත් අංශවල දියුණුවන් ගැන මිනිසා තුල ඇත්තේ ස්වයං ප්‍රශංසාවකි. තමන් සොයාගත් දේ ගැන දෙවියන්වහන්සේටද සිතෙන් හෝ අභියෝග කිරීමට මිනිස් සිත අහංකාරයෙන් උතික්ෂිප්ත වෙයි. **" සිප්පි කටු"** ගැන අපට මතක් වන්නේ මෙවිටයි. ලොව බිහිවූ ශ්‍රේෂ්ඨතම විද්‍යාඥයෙකු වූ සර් අයිසැක් නිව්ටන්ට ඔහුගේ සියලුම විද්‍යාත්මක ජයග්‍රහණයන්ගෙන් පසුවත් **"සිප්පි කටු"** අමතක නොවුණේය. ඔහු මහා බුද්ධිමත් මිනිසා ගැන සිතුවේ මහා සාගරය අබියස වරලේ ඇවිදිමින් සිප්පි කටු අහුලන කුඩා ළදරුවෙකු

ලෙසිනි. සැබෑ කිතුණුවෙකුවූ අයිසැක් නිව්ටන් දෙවියන්වහන්සේට සාපේක්ෂව මිනිසාගේ ශූන්‍යභාවය හොඳින්ම වටහාගෙන තිබුණේය. මේ දේවල් මේ ආකාරයෙන් කියන විට එය අසන සමහරුන්ට නම් **"කටු අනිනවා"** වාගේය. එහෙත් ඇත්ත ඇති සැටියෙන් පිළි නොගැනීම මිනිසාගේ ජන්ම ගතියකි. උපතින්ම මිනිසා පව්කරුවෙකු බව දේව වචනය ප්‍රකාශ කලත් එයද සමහරුන්ට **කටු අනිනවා** වාගේය.

තමා පව්කරුවෙකු බව සෑම කෙනෙක්ම පිලිගත යුතුයි. මන්ද, තමාගේම යහපත් ක්‍රියා ගැන විශ්වාසයෙන් යුතුව කතා කරන අයගේ ධර්මිෂ්ඨ ක්‍රියා දෙවියන්වහන්සේ දකින්නේ කිලිටි වැරහැලි මෙනි. මිනිසාගේ ගැලවීම සඳහා ඇති එකම මාර්ගය දෙවියන්වහන්සේගේ අනුග්‍රහය කරණකොටගෙන අපට සපයාදී තිබේ. එය පිළිනොගන්නා අයට පාපයේ කුලිය වන මරණයේ **"කටුව"** අත්දැකීමට සිදුවීම කටුක වුවත් සැබෑ අත්දැකීමක් වනු ඇත. පාපයෙන් ගැලවීමට නම් යේසුස්වහන්සේ හැර වෙනත් මඟක් නැත. **"කටු චිකිත්සාවෙන්"** වුවත් පාපය නමැති රෝගයට ප්‍රතිකර්මයක් නැත.

**"කටු චිකිත්සාව"** බොහෝ අවස්ථාවලදී සාර්ථක ලෙස ලෙඩ රෝග සඳහා යොදාගැනේ. කටු අනින විට තාවකාලික වේදනාවක් දැනේ. මෙසේ වේදනාව තාවකාලික වුවත් ලැබෙන සුවය ඉමහත්ය. මෙය අත්දැකීමෙන් නොදන්නාවූ අය **කටු චිකිත්සාව** අසාර්ථක වේදනාකාරී ව්‍යායාමයක් ලෙස බැහැර කරති. යම් දෙයක සත්‍යතාවය වටහා ගැනීමට නම් එය අත්දැකීමෙන් අස විඳිය යුතුයි. ඔබේ ජීවිතය "එක් වතාවක්" යේසුස්වහන්සේට විවෘත කර බලන්න. උන්වහන්සේ ඔබව අලුත් මිනිසෙකු කර පාපය නැමති රෝගයෙන් සදාකාලික සුවයක් ඔබට ලබා දෙන සේක.

ධනවන්තයකුට ස්වර්ගයට යාමට කෙතරම් අමාරුදැයි පසක් කිරීමට **ඉදිකටුවක්** යේසුස්වහන්සේ පාවිච්චි කලසේක. ඔටුවෙකුට ඉඳිකටුවක සිදුරෙන් රිංගා යාමට අමාරු යම්සේද, ධනවන්තයෙකුට සඟලොවට ඇතුල්වීමද එතරම් අපහසුය. එසේවන්නේ ඔහු ධනවන්තයෙකු වූ පමණින් අධික පව්කරුවෙකු සේ සැලකීම නොවේ. එහෙත් ධනවන්තයෙකුට යටහත් පහත්කම තුලින් මෙලොව තිබෙන **"කටු"** රිකිලි මැදින් යන ගමන පාවහන් නොමැතිව කටු ගොඩක් මත ගමන් කිරීමට වඩා අමාරු කාර්යයක්.

යමක් කෙලින්ම කීමට බැරිවූ විට සිදුවන්නේ අතන මෙතන **"කටු කුටු"** ගැසීමය. ක්‍රිස්තුස්වහන්සේගේ සැබෑ චරිතය ඇති කෙනෙක් තුල මෙම කටු කුටු ගැසීමේ ජන්ම ගතිව නැත. බොහෝ දෙනෙක් මෙම කටු කුටු

ගෑම ලස්සනට කලත් එය ඉතා කැත පුරුද්දකි. රෝස මල ලස්සන වුවත් **නටුවේ කටු** තිබේ. ක්‍රිස්තුස්වහන්සේ මෙලොව ජීවත්වන කාලයේදී අතන මෙතන කටු කුටු ගැසුවේ නැත. උන්වහන්සේගේ ජීවිතය විනිවිද දැකිය හැකි තරම් පැහැදිලි පවිත්‍රව එකක් විය. ලඟින් ඇසුරු කල පමණින් උන්වහන්සේගේ චරිතය කෙනෙකුට ලැබෙන්නේද නැත. එදා මරියා විසින් යේසුස්වහන්සේගේ පාද සුවඳ විලවුන්වලින් ආලේප කරන විටදී උන්වහන්සේ ලඟින්ම ඇසුරු කළාවූ ගෝලයන් අතර **"කටු කුටු"** වක් ඇතිවිය. මෙම පුරුද්දෙන් ගැලවීමට නම් අප තුල ක්‍රිස්තු චරිතය තිබිය යුතුය.

සමාජයේ අප්‍රසන්න පුද්ගලයින් අතර **"කටු බොඩි"** කාරයින්ට හිමිවන්නේ ප්‍රමුඛස්ථානයකි. මෙවැනි කටු බොඩි කාරයෙක් බවට පත්වෙමින් සිටි පුද්ගලයෙක් අපට **2 සාමුවෙල් 13** පරිච්ඡේදයෙහි මුණගැසෙයි. ඔහු දාවිත්ගේ පුත්‍රයෙකුවූ අම්නොන්ය. පාපකාරී කාරණයක් සම්බන්ධයෙන් කනස්සලුවීම නිසා දවසින් දවස ඔහු අසනීපව කෲෂවෙමින් සිටියේය. කතාව අවසානයේදී ඔහු විසින් භයානක පාපයක් සිදු කරන අතර එම පාපයට අබ්සලොම් විසින් පලිගැනීම නිසා ඔහු මරණයට පත්වෙයි. අද කිතුණුවන් අතර පවා මෙවැනි කටුබොඩි කාරයින් බහුලය. ආත්මික ලෙස කෲෂවූ අය අද "කුඩුකාරයින්" මෙන් සීඝ්‍රයෙන් වැහැරී යති. මෙම ආත්මික කෲෂභාවයෙන් මිදීමට නම් අත්මික ආහාරවලින් පෝෂණය විය යුතුය. එනම් නිරන්තරයෙන් දේව වචනය කියවීම සහ මෙනෙහි කිරීම, යාච්ඤාව හා නමස්කාරය, සභාවේ සහභාගිකම සහ අනෙකුත් ආත්මික කටයුතුවල යෙදීම යනාදියයි.

අවසන් වශයෙන් කටු ගැන මෙවැනි **කටු සටහනක්** තැබීමට කැමැත්තෙමි. කටු ගොකටු පඳුරු මධ්‍යයේ පිපි රෝස මලක් වැනි අත්‍යලංකාරවූ ශෝබමානවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන සිතීම කෙතරම් අපූරුද. සඟලොව සියලු තේජස්, මහිමය අතහැර හිසමත තිබූ රන් කිරුළද පසෙක දමා මෙලොවට පැමිණි උන්වහන්සේ තම හිස මත **"කටු ඔටුන්නක්"** පැලඳවීමට ඉඩ හැරියේ ඇයි. එම්බා මරණය තාගේ ජය කොයිද, එම්බා **මරණය තාගේ "කටුව"** කොයිද කියා අද ලොව පුරා සිටින කිතුණුවන් වන අපට කීමට පුලුවන් වන පිණිසය. ඔබ වෙනුවෙන්ම දිවි දුන්නාවූ එම ප්‍රේමණීය යේසුස්වහන්සේ සිය දයාබර දෑත් ඔබ වෙත දිගු කරමින් සිටින සේක. උන්වහන්සේව ඔබගේ සිත තුලට පිළිගැනීමෙන් අදම ඔබගේ ජීවිතය ආලෝකමත් කර නොගන්නේ ඇයි?

**- ඇලෙක්ස් පෙරේරා -**

# දෙවියන්වහන්සේගේ කරුණාවේ ලක්ෂණ

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇදහිලිවන්තයන් වන අප, දෙවියන්වහන්සේගේ විවිධ ගුණාංග අත්දකින්නෙමු. දෙවියන්වහන්සේගේ **ප්‍රේමය, අනුග්‍රහය, කරුණාව සහ විශ්වාසවන්තකම** ඒ ගුණාංගවලින් කිහි පයකි. කිතුනු ඉතිහාසය පුරාවට මේ ගැන බොහෝ දෙනෙක් දේශනාකර ලියා තිබෙන අතර කවි සහ ගීතිකා නිර්මාණය කර තිබුනත්, අප කිසිවෙකු දෙවියන්වහන්සේගේ ගුණාංග සම්පූර්ණ යෙන් අවබෝධ කර ගැනීමටත් ඒවා පහඳා දීමටත් අසමත්ව සිටින බව අප තේරුම් ගත යුතුය.

අපි **දෙවියන්වහන්සේගේ කරුණාවේ (MERCY of God) ලක්ෂණ කිහිපයක් සලකා බලමු.** බොහෝ විට අපි දෙවියන්වහන්සේගේ අනුග්‍රහය ගැන බොහෝ දේවල් කතා කරන්නෙමු. නමුත් දෙවියන්වහන්සේගේ කරුණාව ගැන ඇති තරම් කතා කිරීමට අපි අපොහොසත් වෙමු. අනුග්‍රහය **(GRACE) යනු, "අපි දෙවියන්වහන්සේගෙන් ලබන්ට වටින්නැති දේ (සමාව) දෙවියන්වහන්සේ අපට ලබා දීමයි".** කරුණාව **(MERCY) යනු, "අපි දෙවියන්වහන්සේගෙන් ලැබිය යුතු දෙය (විනිශ්චය) නොලැබීමයි".** කිංග් ජේම්ස් ඉංග්‍රීසි අනුවාදයෙහි දෙවියන්වහන්සේගේ කරුණාව ගැන විස්තර කිරීමට විවිධ වචන භාවිත කර තිබෙන බව පෙනී යයි. අනෙක් පරිවර්තන සහා භෂාවන්හි ඊට වෙනස් වචන පාවිච්චි වෙන නමුත් ඉංග්‍රීසි කිං ජේම්ස් පරිවර්තනයට අනුව දෙවියන්වහාන්සේගේ කරුණාවේ ලක්ෂ ණ කිහිපයක් දෙස බලා, ආත්මික ගුරුහරුකම් ලබමු.

දෙවියන්වහන්සේගේ කරුණාව පැතිකඩ දහයක් ඇති දියමන්තියකට සමාන කළ හැක. සෑම පැතිකඩයකටම ඊට ආවේනික වූ අලංකාරයක් ඇති අතර, ඒ පැතිකඩ සියල්ලේ අලංකාරයේ එකතුව එම දියමන්තියේ වටිනාකම ප්‍රදර්ශණයකරයි. ඒ ආකාරයටම දෙවි යන්වහන්සේගේ කරුණාවේ සෑම පැතිකඩක්ම වෙන් වෙන් වශයෙන් අද්විතියව, අර්ථවත්ව, ආදාලව තිබෙන අතරේ ඒ සියල්ලේ එකතුව දෙවියන්වහන්සේගේ කරුණාවේ තේජා න්විත භාවය පෙන්නුම් කරයි.

දෙවියන්වහන්සේගේ කරුණාවේ

පැතිකඩ පහක් ගැන මීට පෙර සඟරා කලාපයේ අපි අධ්‍යනය කෙරෙමුව, එම මාතෘකාවන් පහත සඳහන් කර තිබෙන අතර, ඉතිරි පැතිකඩ පහා ගැන මෙම කලාපයේ සළකා බලමු.



1. **බහුල කරුණාව (ABUNDANT MERCY) -1 පේතෘස් 1:3**
2. **මෘදු කරුණාව (TENDER MERCY) - ගීතාවලිය 51:1**
3. **මහත් කරුණාව (GREAT MERCY) - ගීතාවලිය 103:11**
4. **අධික/බොහෝ කරුණාව (MULTITUDE OF MERCY) - ගීතාවලිය 106:45**
5. **අනේකාකාර කරුණාව (MANIFOLD MERCY) - නෙහෙමියා 9:19**
6. **සාදාකාලික කරුණාව (EVERLASTING MERCY) - ගීතාවලිය 103:17**

දේව කරුණාවේ හයවැනි විස්තරය වන්නේ දෙවියන්වහන්සේගේ **සදාකාලික කරුණාවයි.** මෙහිදි අපට දෙවියන්වහන්සේගේ කරුණාවේ තරම දැක ගත හැක. එය සදාකාලිකයි දෙවියන්වහන්සේ ගැන කියවෙන " සදාකාලික" "අනන්ත" යන යෙදුම්වලින් අදහස් වන්නේ "පටන් ගැන්මක් හො අවසානයක් නැත" යන්නයි. එම නිසා අප වෙත ඇත්තාවූ දෙවියන්වහන්සේගේ කරුණාවට පටන්ගැන්මක් හා අව සානයක් නැත. ඒ එසේ වුවද මේ පොළොව මත අපට ඇත්තේ සීමිත ආයු කාලයක් බව මතක තබා ගත යුතු වේ. මේ පොළොව මත අප තාවකාලික දිවියක් ගත කලා වුවද උන්වහන්සේගේ සදාකාලික කරුණාව ඉන් ඔබ්බට පරම්පරා ගණනාවක් තුරාවට හබා එනු ඇත. මෙය කෙතරම් සැනසිලිදායක සිතුවිල්ලක්ද? අපෙන් පසු අපගේ දරුවන්ගේ අනාගතය කුමක් වේදැයි අප බියෙන් සිටිමුව. එහෙත් එක් දෙයක් ගැන ස්ථිරත්වයක් ඇත. එනම් අප මිය ගිය පසුවද දෙවියන්වහන්සේගේ සදාකාලික කරුණාව අපේ මතු පරම්පරාවලටද ගලායන වගයි.

## 7. නොඅඩු කරුණාව (PLENTEOUS MERCY) - ගීතාවලිය 86:5/103:8

දේව කරුණාවේ හත්වැනි විස්තරය වන්නේ දෙවියන්වහන්සේගේ

**නොඅඩු කරුණාවයි.** මෙයින් අපට කථා කරන්නේ දෙවියන්වහන්සේගේ කරුණාවේ ප්‍රමාණය ගැනයි. උන්වහන්සේගේ කරුණාව එතරම් නොඅඩුව තිබෙන නිසාවෙන් අපගේ යාච්ඤා පිළිතුරුවලට එය ඇදී තිබේ. අපට බිය වීමටත් කරදර වීමට වත් කිසිත් නැත. මක්නිසාද දෙවියන්වහන්සේගේ කරුණාව නොඅඩු බැවින් අපගේ සෑම යැච්ඤාවකටම උන්වහන්සේට පිළිතුරු දිය හැකි නිසා.

## 8. නිසැක කරුණාව (SURE MERCY) - යෙසායා 55:3

දේව කරුණාවේ අටවැනි විස්තරය වන්නේ දෙවියන්වහන්සේගේ **නිසැක කරුණාවයි.** අපගේ ජීවිත තුල කුමක් සිදුවුවද දෙවියන්වහන්සේගේ කරුණාව උන්වහන්සේගේ අරමුණ නිසැකව ඉටුකරුණු ඇත. අප දාවිත්ගේ ජිවිතයට එබී බැලූ විට පෙනෙන්නේ ඔහු දෙවියන්වහන්සේගේ සිතට එකඟ වූ මනුෂ්‍යයා සේ හඳුන්වනු ලැබුවද ඔහුගේ ජීවිතය බොහෝ වැරදි අසමත්වීම් සහා වැටීම්වලින් සළකුණු වි තිබූ බවයි. ඒ එසේ වුවද දෙවියන්වහන්සේගේ නිසැක කරුණාව දෙවියන්වහන්සේගේ අරමුණු සහා පොරොන්දු ඉටු කරමින් අවසානයේදී ලෝකයේ ගැළවුම්කරු දාවිත්ගේ පෙළපතින් මේ ලෝකයට ඉපදීමට මඟ පෑදුවේය. එබැවින් අපගේ ජීවිතයේ කුමක් සිදුවූවත් දෙවියන්වහන්සේ තම අරමුණු සහ පොරොන්දු ඉටුකරගන්නා බව දැනගෙන, දෙවියන්වහන්සේගේ නිසැක කරුණාවේ එල්බගෙන සිටිමු.

## 9. ධනවත් කරුණාව (RICH IN MERCY) - එපිස 2:4

දේව කරුණාවේ නවවැනි විස්තරය වන්නේ දෙවියන්වහන්සේගේ ධනවත් කරුණාවයි. ඒ දේව කරුණාවේ ගුණාත්මක භාවයයි. දේව කරුණාවේ ගුණාත්මක බව තේරුම් ගෙන අපට අදාලකර ගැනිමට නම් අපේ ආත්මික දිළිඳු බව සහා බංකලොත් බව හොඳින් වටහා ගත යුතුව තිබේ. **එපිස 2:1-3** අපගේ ආත්මික් දිළිඳු භාවය ගැන වූ ප්‍රකාශ සළකා බලමු.

- ★ **එපිස 2:1 - වැරදි සහා පාප** තුල අප **මැරී** සිටියෙමු.
- ★ **එපිස 2:2 - ලෝකයේ මාර්ගයේ** ඇවිද්දෙමු.
- ★ **එපිස 2:2 - ආකාශයේ බලයේ** කුමරා අනුව ඇවිද්දෙමු.
- ★ **එපිස 2:3 - මාංශයේ තෘෂ්ණාවලට** හැසිරෙන්නේමු.
- ★ **එපිස 2:3 - මාංශයේ හා සිතේ ආශාවන්** ඉටුකරගන්නෙමු.
- ★ **එපිස 2:3 - උදහසේ දරුවන්ව** සිටියෙමු.

දෙවියන්වහන්සේගේ පොහොසත් කරුණාව ක්‍රියාත්මක වූයේ අප ඉහත සඳහන් තත්වයේ සිටියදීම දෙවියන්වහන්සේගේ කරුණාව කොපමණ ධනවත් වූවහොත් එය අපගේ සියලු දිලිදුකම අභිබවා ක්‍රිස්තුස් යේසුස්වහන්සේ සමඟ ස්වර්ගී ක ස්ථානවල හිඳගැනීම දක්වා අපව එසවිය.

## 10. විඳදරන කරුණාව (ENDURING MERCY) - ගීතාවලිය 136:1

දේව කරුණාවේ දහාවෙනි විස්තරය වන්නේ දෙවියන්වහන්සේගේ **විඳදරන කරුණාවයි. ගීතාවලිය 136** යෙහෝවා ස්වාමින්වනහන්සේගේ න් පට න්ගෙන ස්වර්ගයේ දෙවියන් වහන්සේගෙ න් අවසන් කෙරේ. මේ කෙළවර දෙක අතරේ ඉශ්රායෙල් ජිවිතය වාර්තාගත වී තිබේ. ඉශ්රායෙල්වරුන්ගේ සෑම වාතාවරණ හා අත්දැකිම් තුලදි ඔවුන්ව උසුලාගෙන ගියේ දේව කරුණාවයි.

"කරුණාව සදාකල් පවත්නේය" යන වාක්‍ය කණ්ඩයේ තේරුම "සදහටම දේව කරුණාව ඇත" වෙනුවට මාගේ මතයට අනුව අපගේ මුලු ජීවිත කාලය තුලවූ සියළු වාතාවරණ සහා අත්දැකීම් තුලදි "දේව කරුණාව විදදරා සිටි යන්නයි." **ගීතාවලිය 23:6** හි දාවිත් එය මෙසේ දක්වයි "යහාපත්කමත් කරුණාවත් මාගේ <u>**ජීවිතයේ සියළු දවස්වල**</u> මා අනුව එන්නේය." **ගිතාවලිය 89:12,24** සහා **විලාප ගී 3:22-23** දෙවියන්වහන්සේගේ කරුණාව උන්වහන්සේගේ විශ්වාසනීයභාවය සමඟ ඈඳ සදහන් කරයි. එමනිසා අපට මෙලෙසද කිව හැක.

දෙවියන්වහන්සේගේ **විශ්වාසනීය** කරුණාව හෝ **උසුලාගෙන යන** කරුණාව හෝ **විඳදරන** කරුණාව අපගේ උස් පහත් තත්වයන්හිදි, සවියේදි හා දුබලකමේදි, ජය පැරදුමේදි, උසස් පහාත් අක්දැකිම්වලදි අපව දරාගෙන යන්නේ දෙවියන්වහන්සේගේ කරුණාවයි. අද අප මේයාකාරව සිටින්නේ දෙවියන්වහන්සේගේ කරු ණාව ජීවිතයේ සෑම දිනකම සෑම මොහොතකම අපට ඇති නිසාය.

අහෝ මගේ දෙවිඳුනි
ඔබ දයා කඳ!
පැසසීමෙන් පුදුමෙනි
ප්‍රේමෙන් පිරෙයි හද

**- දිනේෂ් මැල්කම් පෝල් -**

# යහපත් යෙහෝෂාපාත් රජ



"ස්වාමීන්වහන්සේ විනිශ්චයකාරයා ණෝය" යන හෙබ්‍රෙව් නාමාරුතිය ලත් "යෙහෝෂාපාත්" රජු පිළිබඳව ආහබ් රජුගේ විස්තර විචාරණයේදී අපි සඳහන් කළෙමු. ඔහු දුෂ්ඨ රජෙක් වූ ආහබ් සමඟ සිරියවරුන්ට විරුද්ධව එක්සිත්ව සටන්කිරීමට සහයවූ අයුරු ඔබට මතක ඇත. යෙහෝෂාපාත්ගේ පියාණන්වූයේ යුදාහි කීර්තිමත් රජුලෙස වසර හතලිස් එකක් රජකම් කළ (**1 රාජාවලිය 15:10**) ආසාය. ඔහුගේ රාජ්‍ය පාලනය. දේව කරුණාවෙන් සඵලවිය. ආසාගේ මරණින් පසු යුදා දේශයේ රාජ්‍ය නායකයා ලෙස යෙහෝෂාපාත් සිංහාසනාරූඪ විය. අවුරුදු තිස්පහක් වැනි දීප්තිමත් යෞවන වියකදි කිරුළු පළන් ඔහු යෙරුසෙලමේ විසිපස් අවුරුද්දක් රජකම් කළේය. අසූබා ඔහුගේ මව් බිසව වූවාය. ක්‍රිස්තුපූර්ව 870 පමණේදී රජබවට පත් යෙහෝෂාපාත් පිළිබඳ දීර්ඝ විස්තර **2 ලේකම් 17 පරිච්ඡේදයේ සිට 20 පරිච්ඡේදය දක්වාත් 1 රාජාවලිය 22 පරිච්ඡේදය** මුළුල්ලේත් අපට උගත හැක.

මෙම විරෝධාර රජුගේ පාලන සමයෙහි ඔහුට අද්නා, නම් යුද්ධයෙහි වික්‍රමාන්විතයෙක් සිටියේය. අද්නා සෙනෙවියා යටතෙහිවූ සේනාංකයෙහි සටන් දක්ෂයන් ලක්ෂතුනක් වූහ. යෙහෝහානාන් තවත් සෙනෙවියෙකි. දෙලක්ෂ අසූදාහක ප්‍රබල හමුදාවක් ඔහු යටතේ වූහ. අමසියා නම් සෙනවියාගේ අණසකට යටත් හමුදාවේ දෙලක්ෂයක් වූහ. එල්යාදා සෙනවියා යටතෙහිවූ දුනුවායන් හා පලිස්දරන්නන් දෙලක්ෂයකි. යෙහෝසාබාද් සෙනවියා යටතෙහි වූ එක්ලක්ෂ අසූදහසක් රජුට මෙහෙකල සේනාවන් සමඟ ගණනය කලවිට එකොලොස්ලක්ෂ හැට දහසක බල ඇණි පහක් යෙහෝෂාපාත්ට උරුමවිය.

## <u>ප්‍රබල සේනාංක</u>

මේ සේනාවෙන් නිසිඵල නෙලාගත්. **"යෙහෝෂාපාත් අතිශයින් උතුම්ව**

**යුදාහි බලකොටුද ගබඩා නුවරවල්ද ගොඩ නැගිය" (2 ලේකම් 17:12).** මේ අයුරින් ස්වකීය රාජ්‍ය බලය තහවුරු කර ගත් රජ අවට රාජ්‍යයන්ට මහත් භිතියක් විය. ඊශ්‍රායෙල් - යුද පිරිස් වල සතුරන්වූ පිලිස්තියයන් ගෙන් ඇතැමෙකු රිදී හා වෙනත් තෑගිද බැටලුවන් හත්දහස් හත්සියයක්ද රජුට කප්පම් වශයෙන් ගෙනා බව **2 ලේකම් 17:11** දක්වයි. වත්මන් යුද්ධ බලඇණි මට්ටමින් වුවද සැලකූවිට යෙහෝෂාපාත් සතුව තිබූ යුද බලය එකලද ඉතාම විශිෂ්ඨ බැව් පෙනේ. දාවිත්, සාවුල්, වැනි ආදිමය රජවරුන්ට මහත් හිසරදයක්වූ පිලිස්තියයන් පවා යෙහෝෂාපාත්ට යටත් වීමෙන් ඔහු ලද නිදහස් යුදාවරුන් සමාදානයත් අධික බවට සැක නැත. **හිතෝපදේශ 22:5** යෙහෝෂාපාත් අත්දුටු සත්‍යයකි. එය අපටද පොදු ධර්මතාවයකි. " **යටත්කමේ ද ස්වාමින්වහන්සේ කෙරෙහි භය වීමේද විපාකය නම් වස්තුවත්, ගෞරවයත් ජීවිතයත්ය"** ඔබම මෙය අත්හදා බලන්නේ නම් මැනවි.

## <u>සමලිංගිකයන් වනසා</u>

යෙහෝෂාපාත් යුදාහි රජකම් කිරීම ඇරඹුයේ එම රාජ්‍යයේ සිව් වැනි රජු වශයෙනි. ඒ වනවිට ඊශ්‍රායෙල්හි රජුව සිටියේ ආහබ්ය. **1 රාජාවලිය 22:40**



අපට පෙන්වන්නේ යෙහොෂාපාත් රජවන විට ආහබ් රජවී අවුරුදු හතරක් ගෙවී තිබූ බවය. එම පරිච්ඡේදයේ **43 පදය** අනුව **"ඔහු තමාගේ පියාවූ ආසාගේ මුළු මාර්ග යෙහි හැසිරෙමින්, එයින් අහක් නොවී, ස්වාමීන්වහන්සේගේ ඇස්හමුයෙහි හරිව තිබුණ දේ කළේය".** මේ නිසාම යුද ට සඵලදායක යුගයක් උදාකළ රජෙක් පිහිටුවනු ලැබිණ. දෙවියන්වහන්සේගේ මාර්ගයෙහි හැසිරෙන ඕනෑම කෙනෙකුට **යොහාන් 14:6** ඉතා වැදගත් වනු ඇත. " **මාර්ගයද සැබෑවද ජීවනයද මමය. මා කරණකොටගෙන මිස කිසිවෙක් පියාණන්වහන්සේ වෙතට යන්නේ නැතැයි"** යේසුස්වහන්සේ කීසේක. යේසුස්වහන්සේ තුළ අදහාගන්නා ස්වාමීන්වහන්සේගේ ඇස්හමුයෙහි හරිවූදේ කරයි. ආසාගේ කාලයේ ඉතිරිව සිටි සමලිංගිකයන් විනාශ කිරීමට යෙහෝෂාපාත් ක්‍රියාකළ බව **1 රාජාවලිය 22:46 දක්වයි.**

මෙම කැත කිළිටි පාපය වරදක් නොවේයයි හඟවමින් ලාබාලයින් ඊට බිලිකරගන්නා නීච තෘෂ්ණා සපුරන්නන්ට "ඒඩ්ස්" නම් මාරාන්තික රෝගය වැළදීමට සැළසීමෙන් දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ උදහස එළිදරව් කර තිබේ. මේ පාපයට ගිජු වූවන් බලුකම්කරන්නන් ලෙසද දක්වා තිබේ. **(ද්විතිය කථාව 23:18)** "බයිබලයේ සතුන්" පොතෙහි බල්ලා පිළිබඳ ලිපියෙහි මෙය ඔබටම කියවා ගත හැක. **රෝම 1:26 හා 27, ලෙවි කථාව 20:13 ද** බලන්න. සමලිංගිකයා අධමයෙකි. මානසික රෝගියෙකි. විකෘති කාමුකයෙකි. එබන්දන් දේශයෙන් ඉවත් කළ යහපත් යෙහෝෂාපාත්!

## දේව වචනය පතල වෙයි.

යෙහෝෂාපාත් ස්වකීය රාජ්‍ය පාලනයේදී ස්වාමින්වහන්සේගේ ව්‍යවස්ථාව යුදා නුවරවල ප්‍රචලිත කිරීමට බොහෝ වෙහෙසදැරීය. ඔහු තමාගේ තුන්වන පාලන වසරේදී ස්වකීය අධිපතීන් වූ බෙන්හයින්, ඔබදියා, ශෙකරියා, නෙතනේල් මිකායාද, ලෙවි වරුන්වූ ෂෙමායා, නෙතනියා, ශෙබදියා, අසාහෙල්, ෂෙමිරාමොන්, යොහෝනාතාන්, අදෝනියා, තෝබියා, ටෝබීය අදෝනියාද, පූජක මෙහෙය උදෙසා එලිෂාමාද හා යෙහෝරාම්ද මේ සේවයට යෙදවිය. ශුභාරංචිය ප්‍රකාශ කිරීම සඳහා ඔබ යම් ප්‍රයත්නයක් (කාලය දීමෙන්, ශ්‍රමයෙන් හෝ මුදලින්) දරයිනම් යෙහෝෂාපාත්ගේ ආදර්ශයට කීකරු වී ඇත.




**(2 ලේකම් 17:5-6)** යෙහෝෂාපාත්ගේ පුත්‍රයන් රියා, යෙහියෙල්, සෙකරියා, අසරියා, (2) මීකා ෂෙපාටිය හා යෙහෝරාම් බව **2 ලේකම් 21:2** දක්වයි. යෙහෝරාම් කුලුදුලා බැවින් ඔහු රාජ්‍යයට හිමිකම් කීවේය. යෙහෝෂාපාත් කළ වරද අතර ඔහු ඊශ්‍රායෙල් රජවූ දුෂ්ඨ ආහබ් සමඟ සිරියවරුන්ට විරුද්ධව යුද්ධයට යාමද අහසියා රජු සමඟ එකතුව තර්ෂිෂ්ට යාමට නැව් සෑදීමද දැක්විය හැක. එම නැව් බිඳීගොස් උත්සාහය ව්‍යවර්ථ විය.

**- ප්‍රන්සිස් විජයසිංහ -**

# කොරෝනා බයිබලයේ ඇසින්

ප්‍රිය මිතුර මිතුරියනි, ගෝලීය වසංගත තත්වයක් බවට පත්වුන කොරෝනා තත්වයන් සමඟ ශුද්ධ බයිබලයෙහි තිබෙන අනාගත වාක්‍යය තේරුම්ගන්නේ කෙසේදැයි සොයා බැලීම වටී. ශුද්ධ බයිබලයේ **එළිදරව් 6 පරිච්ඡේදයේ 8** වන පදයෙහි මෙසේ සඳහන් වේ. **"එවිට සුදුමැලි අශ්වයෙක් සිටිනවා දුටිමි. ඌ පිට හුන් තැනැත්තාගේ නාමය මරණයය පාතාලයද ඔහු අනුව ගියේය. කඩුවෙනුත් සාගතයෙනුත් වසංගතයෙනුත් පොළොවේ වනමෘග යන් ලවාත් මරන්ට පොළොවෙන් සතරෙන් කොටසක් කෙරෙහි ඔවුන්ට බලය දෙන ලද්දේය"**. මෙම යුගයේ අවසාන කාලයේදී පොළව පිට ඇතිවන තත්වයක් පිළිබඳව මෙහි සඳහන්වේ. මේ කාලයේදී පොළව පිට ඇතිවන තත්වයක් පිළිබඳව මෙහි සුලභව දක්නට ලැබේ. කඩුවෙන්, සාගතයෙන්, වසංගතයෙන් හා වන මෘර්ගයන් මඟින් ශුද්ධ බයිබලයෙහි පීඩා කාලය නමින් හඳුන්වන භයානක කාල වකවානුවෙහි බොහෝ දෙනෙක් මිය යයි.

කොවිඩ් 19 ඇතිවන කොරොනා තත්වය නිසා "මෙන්න අවසාන කාලය ඇවිත් තිබෙනවා"යි කියන්නාවූ කියන ප්‍රකාශනය නිවැරදි දැයි අප සොයා බැලිය යුතුය. පීඩා කාලය ලෙස ශුද්ධ බයිබලයෙහි සඳහන්ව ඇති කාලයෙහි සිදුවීමට නියමිත භයානක තත්වය




සමඟ සංසන්දනය කරන විට වර්තමාන තත්වය ඇත්තෙන්ම සුළු අනතුරක්, අකරතැබ්බයක් හා විනාශයක් පමණි.

වර්තමාන කොරෝනා තත්වය සතුන්ගෙන් මිනිසාට සම්ප්‍රේෂණය වී ඇති බව සොයාගෙන තිබෙන නිසා ශුද්ධ බයිබලයෙහි සඳහන් ඉහත දක්වා ඇති දේවවචන කොටස අනාගතයේ ඉටුවිය හැකි බවයි. එනම් එය සිදුවෙමින් පවතිනවා නොව සිදුවීමට යන බවයි. ඒ නිසා අප බිය යුතු නැත. පීඩා කාලය මේ ලෝකයට පැමිණුනා යැයි විශ්වාසකරන්නට තරම් සාධක අප ඉදිරිපිට නැත. නමුත් අප ජීවත්වන්නේ ඊට ආසන්න කාලයකය.

ප්‍රිය මිතුර, මිතුරිය, දේව වචනයේ සත්‍යතාවය ගැන අප පැහැදිලිව දැන ගත යුතුය. පීඩා කාලය පැමිණෙන්නේ ස්වාමීන්වහන්සේගේ වළාකුල් මතට පැමිණීමත්, උන්වහන්සේ සැබෑ ලෙස විශ්වාස කරන්නන් ස්වර්ග යට ඔසවා ගැනීමෙන් අනතුරුවය. ඉන් පසුව ඇතිවන පීඩා කාලය නොහොත් දෙවියන්වහන්සේගේ උදහස පොළො

වට පැමිණෙන්නාවූ කාලයේදී සිදුවිය හැකි බවට ඔප්පු සාක්ෂි මෙම වර්තමාන තත්වයෙන් අපට තේරුම් ගත හැක. එනම් ශුද්ධ බයිබලයේ සඳහන් දේ ඉටුවන බව හා බයිබලය සත්‍යය බවයි. මෙය අප ඉගෙන ගත යුතු ප්‍රධානම සත්‍යතාවයි. මෙම වර්තමාන පීඩාකාරී වසංගත තත්වය තුලින් අප දැකිය යුතු සත්‍යතාවයක් නම් කොරෝනා වලින් මියයන ප්‍රමාණයට වඩා එක්දිනක් තුළ ලෝකය මුලුල්ලේ මිය යන ලක්ෂ සංඛ්‍යාත මිනිසුන් සදාකාලයට එකතුවන බවයි. එලෙසම අද කොරෝනා වලින් අප බේරී සිටියත් එක් දවසක අපටත් මරණය වැළඳ ගන්නට සිදුවන බවයි. මම ඔබෙන් අසන ප්‍රශ්ණය නම්, "ඔබ මරණයට සූදානම් ද?" යන්නයි.

මරණයට මුහුණ දීමට සූදානම් විය හැක්කේ එකම එක සුදුසුකමක් ඇති පුද්ගලයන්ටයි. ඒ දෙවියන්වහන්සේ සමග සමාදාන වූ මනුෂ්‍යයන් පමණයි. දෙවියන්වහන්සේ සමඟ සමාදානය වීමට, උන්වහන්සේ සමඟ අපට තිබෙන අසමදානය වන අපගේ පව්කාර තත්වය නිසා ශුද්ධවූ දෙවියන්වහන්සේගෙන් වෙන්ව සිටියි. මේ තත්වයෙන් අප මරණයට පත්වුනොත් අප අපාගත වෙනවා. මෙන්න මේ භයානක තත්වයෙන් අප මිදීමට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මේ ලෝකයට පැමිණ කුරුසියක් මත මරණයට පත්වූ සේක. ඒ ඔබෙත් මගෙත් පාපවල දඬුවම ගෙවීමටයි. මෙහිදී අප කළ යුත්තේ යේසුස්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීමයි. දෙවියන්වහන්සේ ඔබටත් මටත් ප්‍රේම කරන බව විශ්වාස කිරීමය. යේසුස්වහන්සේ එකම ගැළවුම්කරුවා ලෙස පිළිගැනීමයි. එවිට ඔබගේ සියලු පාපවලට සමාව ලැබෙන බව ශුද්ධ බයිබලයෙහි සඳහන් වේ. එපමණක් නොව දෙවියන්වහන්සේගේ ආත්මය ඔබ තුළ ජීවත්වීමට පැමිණන සේක. එවිට ඔබ ජීවත්වූවත් මරණයට පත්වූවත් දෙවියන්වහන්සේට අයිති කෙනෙක්.

බයිබලයෙහි අවවාදය අනතුරු ඇඟවීම අප සිතට ගත යුතුයි. දේව වචනය සැබෑබව අප තේරුම්ගත යුතුයි. දේව වචනය විශ්වාස කළ යුතුයි. එසේ විශ්වාස කර වර්තමාන ජීවිත කාලයටත් මේ ජීවිතයෙන් ඔබ්බට ඇති සදාකාලයටත් සූදානම් විය යුතුයි. දෙවියන්වහන්සේ හා සමඟ සමාදාන වී උන්වහන්සේගෙන් ලැබෙන පව්කමාව, යේසුස්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීම මඟින් ලබා ගෙන දෙවියන්වහන්සේගේ දරුවෙකු වී සදාකාල ජීවිතය උරුමකරගන්නට වෙර දරන්න.

ඔබට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අදහා ගැනීමෙන් ලැබෙන සැබෑවූ නිත්‍ය වූ සමාදානය අත්වේවා.

**- නෙවිල් ජයසුන්දර -**

**- අන්තර්ජාල පණිවිඩයකි -**

# ගුණවන්ත ස්ත්‍රියක් කාට සම්බවේද?

**හිතෝපදේශ 31:10-31,** දක්වා සාලමොන් රජතුමා තම මව පිළිබඳ ලියූ පද පේලි කිහිපයක් ශුද්ධ බයිබල අපට කියවන්නට ලැබේ. සලමොන් වනාහි මිහිමත සිටිය ප්‍රඥාවන්තම රජතුමාය. ඔහුගේ මව බවට පත් වූ බෙත්ෂේබාය. පියා දාවිත්ය. බෙත්ෂේබා වනාහි නරක ආරම්භයක් තිබූ ස්ත්‍රියකි. නමුත් තම පුත් සාලමොන් ඇය ගැන ලියූ වචන දෙස බලන කල පසු කාලීන හොඳ මවක්, බිරිඳක් බවට පත් වී ඇගේ අවසාන කාලය ප්‍රඥාවන්ත හා දේව භය සහිතව ජීවත් වු බව පැවසිය හැක. මෙම දේව වචන කොටස කියවා මෙනෙහි කිරීමේදී ඔබටත් මටත් බොහෝ පාඩම් අපගේ ජීවිතයට ගත හැක. ඈ ගැන මා දුටු කාරණා කිහිපයක් පහත සටහන් කරමි.

## 01) එවැන්ජලිස්ත හදවත සහිත ගැහැනිය.

**ඇගේ පවුලේ සියල්ලෝ රතු වස්ත්‍ර ඇඳ සිටිති (21 පදය).** එම පදයේම මෙසේ පවසයි. **"හිම නිසා ඇගේ පවුල ගැන ඇයට භයක් නැත".** එනම් ඉදිරි මාසවලදී පැමිණීමට නියමිත හිම සීතල කුණාටුවලට මුහුණ දීමට ඇගේ පවුලේ අය සූදානම් කර ඇත. ඊට අවශ්‍ය පසුබිම සකසා ඇත. "රතු" වලින් බයිබලය අර්ථවත් කරන්නේ යේසුස්වහන්සේ කුරුසියේ වැගුරු රුධිරයයි. මනුෂ්‍යාගේ පාපය පහ කල හැකි හා සෝදා දැමිය හැකි එකම දෙය වන්නේ උන්වහන්සේගේ රුධිරයයි. ඇගේ පවුලේ සියලු දෙනා එම රුධිරයෙන් ආවරණය වී ඇත. එනම් ගැලවීම ලබා ඇත. ඒ සඳහා ඇය වෙහෙස මහන්සි වී ක්‍රියා කර ඇත. පවුලේ සියලු දෙනාටම ස්වාමින්වහන්සේ යටතේ ආරක්ෂාව සලසා දී ඇත. එනම් අනිවාර්යයෙන් ඇයත් ගැළවීම ලබා තිබිය යුතුමය. පවුලේ අයගේ සදාකාලික ජීවනය පිළිබඳ ඇයට සහතිකයක් ඇත. මක්නිසාද අගේ පවුලේ සියලු දෙනාම **"රතු වස්ත්‍ර"** ඇඳ සිටියි. ගැලවීම ලබා සිටියි. මව්වරුනී, බිරින්දෑවරුනී ඔබගේ පවුලේ එවැන්ජලිස්තවරිය ඔබයි, භාරකරු ඔබයි. ආත්මික නායකයා ඔබයි, ගුරුවරිය ඔබයි. **(තිමෝති 1:5 / 3:15)** ඔබගේ පවුලේ සියලු දෙනා ආත්මිකව සුරක්ෂිතද?

## 02) ධර්මිෂ්ඨ හදවත සහිත ගැහැණිය.

**"ඇගේ ඇඳුම් සිහින් ඇඳ රෙදි වලින්ද, අත්නිල් රෙදි වලින්ද සාදා තිබේ"**

**(22 පදය)**

**"ඈ සිහින් රෙදි සාදා විකුණයි"**

**(24 පදය)**

**එළිදරව් 19:8 "සිහින් වස්ත්‍ර නම් ශුද්ධාත්මයාණනවහන්සේගේ ධර්මිෂ්ඨ ක්‍රියා යැයි සඳහන් වේ".** ගුණවන්ත ස්ත්‍රියකගේ තවත් ගුණාංගයක් වන්නේ ධර්මිෂ්ඨ ජීවිතයයි. ඉහත සඳහන් ස්ත්‍රිය ඇඳ සිටින්නේ සිහින් වස්ත්‍රයි. එයින් ඇගේ ධර්මිෂ්ඨ ජීවිතය පෙන්නුම් කරයි. එනම් දෙවියන්වහන්සේගේ අදහාගැනීම කරණකොට ගෙන ඇයට නොමිලේ ලුබුණු ධර්මිෂ්ඨභාවයයි. **(රෝම 5:1 / 8:1)** තම ගැළවුම්කරුවාණන් ස්වාමින්වහන්සේ ලෙස යේසුස්වහන්සේගේ තම ජීවිතයට පිළිගැනීම කරණකොටගෙන දෙවියන්

වහන්සේ විසින් සියලු පාප පහකොට එම තැනැත්තිය හෝ තැනැත්තා ධර්මිෂ්ඨ කොට ගණන් ගනු ලැබේ. එනම් ඇය දැනටමත් එම ධර්මිෂ්ඨකමට අයිති වේ.

**24 පදයෙහි** සඳහන් වන්නේ **"ඇය සිහින් වස්ත්‍ර සාදා විකුණයි".** එනම් ඇය වෙහෙස මහන්සි වී සිහින් වස්ත්‍ර සාදයි. මෙයින් මා අදහස් කරන්නේ තමා හිතාමතා කරන ධර්මිෂ්ඨ ක්‍රියායි. එනම් තමන්ගේ ක්‍රියා මගින් ධර්මිෂ්ඨව ජීවත් වීමයි. ධර්මය ඉෂ්ඨ කිරීම, නොහොත් ධර්මයට අනුව ජීවත් වීම හා ක්‍රියා කිරීමයි. දේව වචනය අනුව තම ජීවිතය හැඩ ගන්වා ගැනීම හා ඒ අනුව ජීවත් වීම හා ක්‍රියා කිරීම දෙවියන්වහන්සේ ප්‍රිය කරන ප්‍රියයන්ගේ චරිත ලක්ෂණයන් වේ.



## 03) ආයෝජන හදවත සහිත ගැහැනිය.

**"ඈ කෙතක් ගැන කල්පනා කොට ඒක මිලට ගන්නීය. ඇගේ අත්වල ලාභයෙන් ඈ මිදිවත්තේ වවන්නීය" - (16 පදය)**

**"ඇගේ වෙළඳාමෙන් හොඳ ලාභ ලැබෙන බව ඈට දැනේ" - (18 පදය)**

අරපිරිමැස්ම හා ලෝභකම යනු එකිනෙක වෙනස් ගති ලක්ෂණ දෙකකි. තමාට ගැලපෙන ආර්ථිකයක් පවුලට සාදාගැනීමට ගෙදර භාරකාරත්වය දරන අම්මාට, භාර්‍යාවට හැකියාවක් ඇත. අනාගතය ගැන සිතා කටයුතු කිරීම හා ඒ සඳහා පවුලේ අය මෙහෙය වීම, පසුකාලීනව පවුලේ ආයෝජනයක් බවටත් පත් වේ. සෑම විටම ඇඳුම් පැළඳුම්, ගමන් බිමන් ආදී තම පවුලේ ආර්ථිකයට ගැලපෙන ආකාරයට සැලසුම් කිරීම මගින් දීර්ගකාලීනව හා කෙටිකාලීනව පහසු ජීවිතයක් උදා කරයි. පවුලේ ආර්ථික දියුණුව උදෙසා ක්‍රියා කිරීම ඉතාමත් වැදගත් කාරණයකි.

**"ඥානවන්ත ස්ත්‍රී තොමෝ තම පවුල ගොඩනගන්නීය" (හිතෝපදේශ 14:1).**

## 04) කඩිසර හදවත සහිත ගැහැණිය.

**"ප්‍රීතියෙන් ඇගේ අත් වලින් වැඩකරන්නීය" (13 පදය).**

**"ඈ වෙළඳ නැවක් මෙනි" (10 පදය).**

**"ඈ රැයින්ම නැගිට, ඇගේ පවුලේ අයට ආහාරත්....." (15 පදය).**

කඩිසරකම සාලමොන් තම මවගෙන් දුටු තවත් ගුණාංගයකි. කාන්තාවන්ට තිබිය යුතුම ගුණාංගයක් වන්නේ කම්මැලිකම පරාජය කල කඩිසර ක්‍රියාශීලිත්වයයි. ආත්මික ක්‍රියාකාරකම් උදෙසාද කඩිසරකම අවශ්‍යය. බයිබලය කියවීම, ඉගෙනගැනීම, යාඥා කිරීම, නමස්කාර ජිවිතය, කඩිසර කමින් කළ යුතුය. එමෙන්ම ජීවිතයේ දිනපතා සියලු දේ කඩිසරව කිරීමෙන් ජීවන මට්ටම වෙනස් කල හැකිය.

## 05) කරුණාවන්ත හදවත සහිත ගැහැණිය.

**"ඇගේ දිවෙහි කරුණාවන්ත, දැනමුතුකම තිබේ" - (26 පදය)**

**"ඇගේ හස්තය අසරනයා දෙස විහිදන්නීය. ඇගේ අත් දිළින්දා වෙතට දිගු කරන්නේය" - (20 පදය)**

කරුණාවන්තකම, ගුණවන්තකම ගැහැණියක් සතු මහත් ආභරණයයි. දෙවියන්වහන්සේ තුලද යේසුස්වහන්සේ තුලද කැපී පෙනෙන ගුණාංගය වන්නේ කරුණාවන්තකමයි. ඈ කරුණාවන්තව අසරණයාටත්, දුප්පතාටත් පිහිට වෙයි. තම දරුවන්ට, පවුලේ අයට, ස්වාමිපුරුෂයාට, මවට, පියාට ඕනෑම කෙනෙකුට කරුණාවන්තව ආමන්ත්‍රණය කිරීමෙන්ම බොහෝ ප්‍රශ්න විසඳාගත හැක. සලමොන්ගේ මව බොහෝ කරුණාවන්ත තැනැත්තියක්ව සිටියාය.

## 06) ප්‍රඥාවන්ත ගැහැණිය.

**"ඈ නුවණින් යුක්තව ඇගේ මුඛය විහිදන්නිය" - 26 පදය.**

**"ඈ රෙදි වියා විකුණයි" - 24 පදය.**

මෙම **හිතෝපදේ 31** වන පරිජේදය පුරාවට හොදින් කියවන විට පෙනෙන්නට තිබෙන්නේ ඇයගේ ප්‍රඥාවන්තකමයි. ඇගේ කාලය සැලසුම්කර හොඳින් පාවිච්චි කිරීම තුළ බොහෝ ලාභ උපයයි. එමෙන්ම කරදර අඩු හා ප්‍රශ්න අඩු ජීවිතයකට මඟ පාදයි. හිතෝපදේශ පොත පුරාවටම ප්‍රඥාවන්තව හැසිරීමේ වැදගත්කම අපට උගන්වයි. ප්‍රඥාව යනු කපටිකම නොවේ. ගෙදර භාර්යාව, අම්මා නුවණින් හැසිරෙන විට පවුලේ අන් අයටත් එයට පුරුදුවීමට සිදු වේ. සමාදානයේ නිවසක අවශ්‍ය කාරණය වන්නේ පවුලේ භාරකාරිය ප්‍රඥාවන්තව ක්‍රියා කිරීමයි.

## 07) භක්තිවන්ත හදවත සහිත ගැහැණිය.

**"ඇගේ දරුවෝ නැගිට ඈට ආශිර්වාද කරති; ඇගේ පුරුෂයාත් ඈට ප්‍රශංසාකරයි" - (28 පදය)**

**"රූපශ්‍රීය රැවටිලි සහිතය, ශෝභනකම නිෂ්ඵලය, ප්‍රශංසාව ලැබෙන්නේ ස්වාමීන්වහන්සේගෙන්ය" - (30 පදය)**

**"ඇගේ ක්‍රියා දෙරටුවලදී ඈට ප්‍රශංසා කෙරෙත්වා" - (31 පදය)**

දෙවියන්වහන්සේ කේන්ද්‍ර කරගත් ජීවිතයක අවසානය දෙවියන්වහන්සේ ගෙන් ප්‍රශංසාව ලැබීමයි. භක්තිවන්ත ජීවිතය ආරම්භය වන්නේ නැවත ඉපදීම ලැබීමෙනි. එනම් තමන්ගේ ගැලවුම්කරු සහ ස්වාමින්වහන්සේ ලෙස යේසුස්වහන්සේ පුද්ගලිකව අදහාගෙන දිනපතා උන්වහන්සේ අනුග මනය කිරීමයි. තවද බයිබලය කියවමින්, යාච්ඤා කරමින් යේසුස්වහන්සේගේ මඟ පෙන්වීම මත උන්වහන්සේගේ කැමැත්ත ඉටු කරමින් යන ජීවිතය භක්තිවන්ත ජීවිතයයි. එසේ කරන විට රූපශ්‍රීය, ලෝකයේ ආශාවන්, තරඟකාරී ජිවිත රටාව වැනි දේ වලින් ලෙහෙසියෙන්ම ජය ගතහැක. සාලමොන් තම මව ඉතා භක්තිවන්ත ජීවිතයක් ගත කල බව පවසයි. එය ඔබටත් අභියෝගයක් වේවා !

**- ජීවන හඬ -**

# අප මධ්‍යස්ථානයේ පැවැත්වෙන රැස්වීම්.

## ඉරිදා

පෙ.ව 8.15 - 9.15 - ඉරිදා පාසැල
අවුරුදු 3-18 දක්වා ළමුන් සඳහා

පෙ.ව 9.30 - 12.00 - රොටි කැඩීමේ හා නමස්කාර රැස්වීම
(සිංහල , දෙමළ , ඉංග්‍රීසි)

ප.ව 4.00 - 5.00 - සුභාරංචි රැස්වීම - (සිංහල)

ප.ව. 6.00 - 7.00 - සුභාරංචි රැස්වීම - (ඉංග්‍රීසි)

## අඟහරුවාදා

ප.ව 6.30 - 7.30 - සුභාරංචි රැස්වීම
(දෙමළ)

## බදාදා

ප.ව 6.00 - 7.30 - යාච්ඤා රැස්වීම
අසනීප අය සඳහා තෙල් ආලේප කර
යාච්ඤා කිරීම

## සිකුරාදා

ප.ව 6.00 - 7.30 - බයිබල් අධ්‍යයනය

**ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය**
අංක - 07, විවේකානන්ද පාර,
වැල්ලවත්ත,
කොළඹ 06.
දුරකථන අංක : 011 2 581 901 / 077 8 813 197
www.christianfellowshipcentre.com

NMA GRAPHICS
No. 246/1, Galle Road, Ratmalana.
Tel: 011 2 730 644 / 071 4 286 295 / 077 4 223 020
E-mail : nmagraphics2001@gmail.com